මධ්‍යම පළාත් සභාව - 2012

------------------------------

1 **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය ව්‍යාවචනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **අනෙකුත් ගිණුම්**

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව 2013 අප්‍රේල් 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | 2012 වර්ෂයට අදාල | | |
|---|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කල ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකල ගිණුම් සංඛ්‍යාව |
| (i) විසර්ජන ගිණුම් | 32 | 32 | - |
| (ii) ආදායම් ගිණුම් | 02 | 02 | - |
| (iii) පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 65 | 65 | - |
| (iv) වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 04 | 02 |
| (v) ප්‍රඥප්ති ගිණුම් | 02 | - | 02 |
| (vi) මන්ත්‍රී අත්තිකාරම් ගිණුම | 01 | 01 | - |
| | 108 | 104 | 04 |

මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පිහිටවූ 2008 අගෝස්තු 12 දින සිට 2014 අප්‍රේල් 30 දින දක්වා ගිණුම් ඉදිරිපත් කර නැත.

(ආ) 2008 අගෝස්තු 22 දිනැති අංක 1563/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ ඇතුළත් ආයතන ප්‍රඥප්තියේ 6 ඡේදය ප්‍රකාර කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයට අදාල ගිණුම් පවත්වා ගතයුතු බවත්, එම ගිණුම් එහි 6.5 ඡේදය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් විගණනය කළයුතු බවත්, එකී ආයතනයේ සියලුම ගිණුම් වාර්තා විගණනය කිරීමෙන් පසු එක් එක් ගිණුම් සම්බන්ධයෙන් ඊට පසු වර්ෂයේ මාර්තු 31 දිනට පෙර මධ්‍යම පළාත් සභාව වෙත ඉදිරිපත් කළයුතු බවත් දක්වා තිබුණද, ආයතනය පිහිටවූ දින සිට ඊට අදාල ගිණුම් පිළියෙල කර විගණනය සඳහා 2014 අප්‍රේල් 30 දින වනවිටද ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.426,165 ක බීජ තොගයක්ද, වර්ෂය තුළ රු.473,080 ක බීජ මිලදී ගැනීමක්ද සිදුවී තිබුණු අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ගල්පාලම ගොවිපලේ පරිභෝජනය සඳහා තිබූ බීජ තොගයේ පිරිවැය රු.899,245 ක් විය. එහෙත් වර්ෂ අවසාන බීජ තොගය රු.966,193 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය තුළ ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා භාවිතා කරන ලද කැරට්, ලීක්ස්, අර්තාපල් ආදී වගාවන් සඳහා ඉදිරිපත් කළ නිෂ්පාදන ගිණුමේ සඳහන් නිෂ්පාදන පිරිවැය තුළ අන්තර්ගත නොවීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ආයතනවලින් ලැබෙන ඇණවුම් ලේඛනයට අනුව රජයේ ආයතන සඳහා සපයන ලද නිෂ්පාදන වෙනුවෙන් 2012 වර්ෂයට අදාල රු.131,096 ක මුදලක් අයවිය යුතුව තිබුණද එම වටිනාකම වාණිජ අත්තිකාරම් ගිණුමේ ණයට විකුණුම් සහ ණය ගැතියන් යටතේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ කාර්මිකාවන් වෙනුවෙන් ගෙවූ සේවක අර්ථසාධක අරමුදලේ සේව්‍ය දායකය රු.2,503,935ක් හා සේවක භාරකාර අරමුදලේ සේව්‍ය දායකය වූ රු.625,988ක් අදාල ගිණුම්වලට හර නොකොට වැටුප් හා වේතන ගිණුමට හර කිරීම නිසා වැටුප් හා වේතන ගිණුම රු.3,129,923 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පේෂකර්ම මධ්‍යස්ථාන 05 ක භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඉන්ධන හා දරවල වටිනාකම රු.72,600 ක් වුවද ගිණුමේ එය රු.159,656 ක් ලෙස සටහන් කිරීම නිසා වර්ෂයේ ලාභය රු.87,056 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හදිසි ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය සමඟ ඇති කර ගත් එකඟතාවය මත ව්‍යාපෘතිය වෙනුවෙන් අධිකාරිය විසින් අත්තිකාරම් ස්වරූපයෙන් දරන ලද රු.8,261,699ක වියදමක් ව්‍යාපෘතිය තුළින් අය නොවන බැවින් ඉන් රු.6,481,393ක මුදලක් සමාලෝචිත වර්ෂයේ වියදමක් සේ සළකා ගිණුම් ගත කර තිබූ අතර, ශේෂය වූ රු.1,780,306ක මුදල ඉදිරි වර්ෂයේදී ලාභයට එරෙහිව කපා හැරීමට තීරණය කර තිබුණි.

(ඊ) මඟී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකා ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු විශේෂ චාරිකා ආදායම් ගාස්තුව වූ රු.454,538 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

### 1.2.3 <u>බැංකු සැසඳුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් දෙපාර්තමේන්තු හා ආයතන 02 ක බැංකු ගිණුම් 02 කට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදවී තිබුණි.

(ආ) මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි නොවූ තැන්පතු රු.1,288,904 ක් සම්බන්ධයෙන් බැංකුවෙන් විමසා පසුවිපරම් කටයුතු කර නොතිබුණි.

(ඇ) අගය රු.426,191 ක් වූ අහරු චෙක්පත් 26 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කර නොතිබණි.

(ඈ) බැංකු ගිණුම් 7 කට අදාල හඳුනා නොගත් හර රු.162,405 ක් හා හඳුනා නොගත් බැර රු.2,643,703 ක් වී තිබුණි.

### 1.2.4 <u>ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් වසර 05 ක් තුළ ණය පදනම මත සිදු කළ රෙදි අලෙවි කිරීම්වලින් රු.983,658 ක මුදලක් වැඩිපුර අය කර තිබූ නමුත් අදාල පුද්ගලයන් හඳුනාගෙන එම මුදල පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ එක් එක් අත්තිකාරම් ගිණුම් කටයුත්ත වෙනුවෙන් ලැබිය යුතුව තිබුණු රු.360,779 ක වර්ෂයකට අධික කාලයක් තිස්සේ හිඟව පැවතුණි.

(ඇ) පේෂකර්ම නිශ්පාදන ණයට විකිණීමෙන් රු.7,278,881 ක මුදලක් දෙපාර්තමේන්තුවට ලැබිය යුතුව තිබුණු අතර එම ශේෂය තුළ වර්ෂ 1 සිට 5 දක්වා කාලයකට අයත් ශේෂ පැවතුණි.

(ඈ) යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල විසින් සිදු කරන ලද බාහිර වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට ලැබිය යුතු රු.1,852,299ක මුදලක් ගෙන්වා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශිය ලේකම් කාර්යාල 26 ක පැවති හිඟහිටි වාහන ආදායම් බලපත්‍ර හා රජයේ ඉඩම් සඳහා හිඟහිටි බදු ආදායම රු.22,367,404 ක්ව පැවතුණු අතර ඒවා අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.

(ඊ) මගී ප්‍රවාහන සේවා අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතුව පැවති කඩ කාමර කුලී ආදායම රු.644,400ක් වුවත් ඉන් රු.26,450ක් පමණක් අයකර ගෙන තිබුණි. කුලී අයවීමේ

ප්‍රතිශතය සියයට 4 ක් වැනි ඉතා පහල මට්ටමක පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සමස්ථ හිඟ කඩකාමර කුලිය රු.2,097,650 ක් වූ අතර එය වසර 01 සිට වසර 07 දක්වා වූ කාල පරාසයක් තුළ පැවත එමින් තිබුණි.

(උ) පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් 2007 සිට 2011 දක්වා වර්ෂ තුළ ආයතන 67කට අයත් නිලධාරීන් වෙත රු.1,489,853ක ණය පදනම මත රෙදි අලෙවි කර තිබුණද, ඉන් එකදු වාරිකයක් හෝ අයකර නොතිබුණි. පසුගිය වසර 05ක් තුළ ණය පදනම මත සිදු කළ රෙදි අලෙවියෙන් රු.14,349,569 ක මුදලක් අයවිය යුතුව තිබුණද, ඒවා අයකර ගැනීමට ප්‍රමාණවත් පියවරක් ගෙන නොතිබුණි.

### 1.2.5 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු.94,599,726 ක් වූ පොදු තැන්පත් ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්**

2012 දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුම් 110 කට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.400,800,407 ක් විය.

(ආ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් ඔප්පු, සමීක්ෂණ මණ්ඩල වාර්තා, වාහන ලේඛන, ශේෂ සනාථ කරන ලිපි, ණය ලිපිගොනු, යනාදී අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,040,242,689 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) **ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම**

එකතුව රු.102,275,768 ක් වූ ගෙවීම් වවුචර් පත් 171 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.7 අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **2000 අංක 01 දරන මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය** | |
| අංක 6 සහ 19 (ආ) වගන්ති | මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් මාර්ග බලපත්‍ර නිකුත් කළ යුතු වුවද, එබදු අනුමැතියකින් තොරව එහි සභාපතිවරයා විසින් 2011 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ මාර්ග බලපත්‍ර 142 ක් නිකුත් කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.103(1)(ආ), 104(1),104(3) සහ 104(4) | මහනුවර, මාතලේ හා නුවරඑළිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට අයත් වාහන 19 කට සිදුව තිබු අනතුරු සම්බන්ධයෙන් පොලිස් පැමිණිලි නොතිබු අතර වාහන 04 කට අදාළ අනතුරු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ ද, වාහන 09 කට සිදුව තිබු අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ද, වාහන 16 කට සිදුව තිබු අනතුරු සම්බන්ධව පරිපූර්ණ වාර්තා ද පිළියෙල කර නොතිබුණි. |
| (ii) මු.රෙ.1645(අ) | වාහන ලොග් පොත් යාවත්කාලීනව නඩත්තු කළ යුතු වුවත්, පන්විල හා උඩුවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවලට අයත් වාහන 02 ක ලොග් පොත්වල වාහනය පිළිබඳ විස්තර සහ ගමන් පිළිබඳ මාසික සාරාංශ පිළියෙල කර නොතිබුණි. |
| (iii) මු.රෙ.1646 | ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ වාහන 9 ක දෛනික ධාවන සටහන් අඛණ්ඩව ඉදිරිපත් කර නොතිබූ අතර, ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අයත් වාහනයක, දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහය

(i) ප.මු.රී.64 සහ 64(2)(2)(අ) — සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයට අදාලව 2012 වර්ෂයේදී සිදුකළ රු.1,571,486 ක කල් ඉකුත් වූ ගෙවීම් සඳහා සහතික ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප.මු.රී.169.1 — ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් අවස්ථා 21 කට අයත් රු.5,663,197 ක් වටිනා වවුචර් සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි.

(iii) ප.මු.රී.471(1) — අවස්ථා 5 කදී නාරම්පනාව රෝහලට ලැබී තිබූ ඖෂධ වර්ග 68 ක්, තිත්තපජ්ජල පර්යන්ත රෝහල වෙත අවස්ථා 7 කදී ලැබී තිබූ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතම 20 ක් හා අවස්ථා 4 කදී ලැබී තිබූ ඖෂධ වර්ග 14 ක් තොග ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) ආයතන සංග්‍රහය

(i) xii පරිච්ඡේදයේ 14.2, සහ 14.4 වගන්ති — තාවකාලික පදනම මත සේවයේ යොදා ගන්නා අයවළුන් හට සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනිමට හිමිකමක් නොමැති වුවද, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ එක් වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගන්නා ලද අයකු හට වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාදී කොන්ත්‍රාත් කළමනාකරණ පුහුණු පාඨමාලා ගාස්තු ලෙස රු.50,000 ක්ද ගෙවා තිබුණි.

(ii) xiv පරිච්ඡේදයේ 8 වගන්තිය — කර්මාන්ත අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියකට අදාලව අවස්ථා 09 කදී සම්පත් දායක ලෙස සහභාගි වු අයෙකුට සැතපුම් කලී ගෙවීම නොසලකා දින 09 ක් සඳහා ප්‍රවාහන වියදම් ලෙස රු.72,000 ක් ගෙවීම් කර තිබුණි.

(iii) xix පරිච්ඡේදයේ 5 වගන්තිය — කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රජයේ නිවාසවල පදිංචි නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවියයුතු රු.35,656 ක නිවාස කුලී පළාත් සභාව විසින් අයකර ගෙන නොතිබුණි.

(iv) xix පරිච්ඡේදයේ 5.8 වගන්තිය — රජයේ නිවාසවල පදිංචි නිලධාරීන් පරිභෝජනය කරනු ලබන ජලය හා විදුලිය සඳහා වන ගාස්තු එහි පදිංචි නිලධාරීන් විසින් පමණක් ගෙවිය යුතු වුවත්, දොලොස්බාගේ රෝහලේ හෙද නිවාසයේ 2010 ජනවාරි සිට 2012 ඔක්තෝබර් දක්වා රු.160,548 ක් වූ විදුලි බිල්පත් නිවාසවල පදිංචිකරුවන්ගෙන් අය කර නොගෙන සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණ.

| | |
|---|---|
| (v) xix පරිච්ඡේදයේ 5.2.1 උප වගන්තිය | නුවරඑළිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් උපලේඛන ගත නිවාස බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවූ රජයේ නිවාස 07 කින් උපලේඛනගත නිවාස ලෙස සළකා විවාහක නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක්ද, අවිවාහක නිලධාරීන්ගෙන් වැටුපෙන් සියයට 5 ක්ද ලෙස නියමිත කුලියට අඩුවෙන් රු.198,467 ක් අය කරගෙන තිබුණි. |

(ඉ) <u>චක්‍රලේඛ</u>

(i) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

| | |
|---|---|
| * 1994 ජූලි 01 දිනැති අංක 24/94 දරන චක්‍රලේඛයේ 2 ජේදය සහ 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 2 ජේදය | රැස්කරනු ලබන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ඊලඟ මාසයේ 05 දිනට පෙර එම අරමුදල වෙත යැවිය යුතු වුවද, 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා රු.1,459,872,806 ක දායක මුදල් එසේ යවා නොතිබුණි. |
| * 2008 ජූනි 26 දිනැති අංක 13/2008 හා 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන චක්‍රලේඛ | රාජකාරි අවශ්‍යතා සපුරා ගැනීම පිණිස නිල වාහන සඳහා ඉන්ධන සීමා සළසා තිබුණද, එම සීමා ඉක්මවා අනුමැතියකින් තොරව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් විසින් ඇණවුම් මගින් රු.585,602 ක් වටිනා ඉන්ධන ලීටර් 4410 ක්ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අවස්ථා 23 කදී රු.118,806 ක් වටිනා ඉන්ධන හා මහනුවර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් රු.144,934 ක් වටිනා ඉන්ධන ලීටර් 1399 ක්ද ලබාගෙන තිබුණි. |
| * 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛය | මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරිවරයා හට (III ශ්‍රේණිය) වෙන්කළ වාහනයකට හිමිකම් නොතිබුණද, රජයේ වාහනයක් භාවිතා කර 2012 ජනවාරි සිට අගෝස්තු දක්වා රු:434,584 ක් වටිනා ඉන්ධන ලීටර් 2957 ක් ලබාගෙන තිබුණ. |

(ii) <u>ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ</u>

| | |
|---|---|
| * 2006 පෙබරවාරි 10 දිනැති අංක CSA/1/1/2006 දරන චක්‍රලේඛය | රජයට සම්බන්ධ පුද්ගලයන් විසින් යෙදෙන්නාවූ සියලුම නිල විදේශ ගමන්වලින් රටට යම් ප්‍රතිලාභයක් අත්විය යුතු බවත් මෙම මූලික ප්‍රතිපත්තියට අනුව ඕනෑම ආකාරයක නිල විදේශ ගමනක් සඳහා අනිවාර්යයෙන්ම බලවත් යුක්ති සහගත හේතුවක් තිබිය යුතු බවත් දක්වා තිබුණද, ඊට පටහැනිව මධ්‍යම පළාත් සභාවේ මන්ත්‍රීවරුන් |

| | |
|---|---|
| | 2010 හා 2011 වර්ෂවලදී ඉන්දියාව, වියට්නාමය වැනි රටවලට සංචාරය කර තිබූ ආකාරයටම 2012 වර්ෂය තුළදීද දින 7 බැගින් අවස්ථා 3 කදී චීනයට යාම වෙනුවෙන් සහා ලේකම් ඇතුළු මන්ත්‍රීන් 62 දෙනෙකු සඳහා රු.17,083,778 ක් වැය කර තිබුණි. |
| * 1993 දෙසැම්බර් 31 දිනැති අංක PPA/6/1/1 හා 2010 ජූලි 09 දිනැති අංක CA/1/1/16/1 දරන චක්‍රලේඛය | විදේශ නිල සංචාරයක යෙදී ආපසු දිවයිනට පැමිණීමෙන් දින 07 ක් තුළ සංචාරය පිළිබඳ සවිස්තරාත්මක කරුණු ඇතුළත් වාර්තාවක් විදේශ ගමන අනුමත කළ නිලධාරියා වෙත ඉදිරිපත් කළයුතු වුවද, චීන සංචාර නිමවී 2013 අප්‍රේල් 30 දිනට මාස 04 ක පමණ කාලයක් ගතවී තිබුණද එවැනි වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

(iii) <u>ජාතික අයවැය චක්‍රලේඛ</u>

| | |
|---|---|
| * 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන චක්‍රලේඛය | ආරාධනා පත්, දින පොත්, සුභපැතුම් පත් වැනි අත්‍යාවශ්‍ය නොවන ක්‍රියාකාරකම් සඳහා දරනු ලබන වියදම් සීමා කළයුතු බව දක්වා තිබුණත්, ඊට පටහැනිව සභා ලේකම් කාර්යාලය විසින් අවස්ථා 04 කදී රු.427,500 ක මුදලක් වැයකර සුභ පැතුම් පත් හා දින පොත් මුද්‍රණය කර තිබුණි. |

(iv) <u>වෙනත් චක්‍රලේඛ</u>

| | |
|---|---|
| * 2009 ඔක්තෝබර් 30 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ලිපිය | අධීක්ෂණ මන්ත්‍රීවරුන් විසින් සිය ගමන් වියදම් ඉල්ලුම් කිරීමේදී අධීක්ෂණ කටයුතුවලට අදාල වාර්තාවක් නියමිත ආකෘතියේ සකස් කර අමාත්‍යාංශය වෙත භාරදිය යුතු වුවත්, එසේ කටයුතු නොකර සෞඛ්‍ය අමාත්‍යාංශ අධීක්ෂණ මන්ත්‍රීවරුන් 5 දෙනෙකු විසින් 2012 වර්ෂයේදී රු.655,567 ක ගමන් වියදම් හා දීමනා ලබාගෙන තිබූ අතර, තවත් අධීක්ෂණ මන්ත්‍රීවරුන් 4 දෙනෙකු විසින් රෝහල් අධීක්ෂණ කටයුතු වෙනුවෙන් ලබාගන්නා ලද ගමන් වියදම් සඳහා සාවද්‍ය දුර ප්‍රමාණයන් දක්වමින් සමාලෝචිත වර්ෂයේදී රු.102,718 ක මුදල් වැඩිපුර ලබාගෙන තිබුණි. |
| * 2010 මැයි 25 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | ගොවිපලේ සේවය කරන සේවකයන් 10 දෙනෙකුට අදාලව 2012 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා වැටුප් වශයෙන් රු.1,257,250 ක් ගෙවා තිබූ නමුත් ඊට අදාල රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සේවා, සේවක දායකය වශයෙන් රු.251,450 ක මුදලක් අරමුදලට යැවීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| * 2011 මාර්තු 27 දිනැති දේශීය ආදායම් කොමසාරිස්ගේ අංක:IRD/PAYB/RA GE/01 දරන ලිපිය | මාසිකව රු.50,000 කට වඩා වැඩි වැටුපක් ලබා ගෙන තිබූ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වෛද්‍යවරුන් 154 දෙනෙකුගෙන් 2011 ජුලි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව වෙනුවෙන් රු.1,009,432ක උපයන විට ගෙවීම් සඳහා බදු ගණනය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

2. **ආදායම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ආදායම් පරිපාලනය**

ඉදිරිපත් කර තිබුණු ගිණුම් අනුව පසුගිය වර්ෂ 03 ක රැස්කළ ආදායම පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | 2010 | 2011 | 2012 |
|---|---|---|---|
| | | දෙසැම්බර් 31 දිනට | |
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 2,668,851,691 | 3,685,121,035 | 3,852,936,300 |
| බදු නොවන ආදායම | 332,880,166 | 941,317,077 | 1,002,353,327 |
| එකතුව | 3,001,731,857 | 4,626,438,112 | 4,855,289,627 |
| | ========== | ========== | ========== |

(ආ) අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දික්ඔය ග්‍රාම නිලධාරි වසමේ පෞද්ගලික සමාගමක් විසින් කිලෝ වොට් 960 ක ධාරිතාවයකින් යුතුව ඉදිකරන ලද කුඩා පරිමාණ ජල විදුලි බලාගාරය වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව 2011, 2012 සහ 2013 යන වර්ෂ 3 වෙනුවෙන් ජල හැරවුම් බදු මුදල ලෙස අයවිය යුතු රු.316,800 ක මුදල් අයකර ගෙන නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.774,945,578 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,114,308,964 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,889,254,542 ක පිරිහීමක් නිරීක්ෂණය විය. එම පිරිහීම කෙරෙහි ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන වියදම රු.1,073.516,625 කින් වැඩිවීම හා මූලධන වියදම රු.547,543,613 කින් සමාලෝචිත වර්ෂයේදී වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

දෙසැම්බර් 31 දිනට ආදායම

| | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| පළාත් සභා විෂයයන්ට අදාල ආදායම් | | | | | | |
| බදු ආදායම් | 4,612 | 3,853 | 759 | 3,325 | 3,685 | (360) |
| බදු නොවන ආදායම් | 428 | 1,002 | (574) | 325 | 941 | (616) |
| | 5,040 | 4,855 | 185 | 3,650 | 4,626 | (976) |
| රජයේ ප්‍රදාන | 17,311 | 15,532 | 1,779 | 17,948 | 16,029 | 1,919 |
| එකතුව | 22,351 | 20,387 | 1,964 | 21,598 | 20,655 | 943 |

දෙසැම්බර් 31 දිනට වියදම

| | 2012 | | | 2011 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. | රු.මි. |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 15,157 | 14,752 | 405 | 14,156 | 14,128 | 28 |
| අනෙකුත් | 3,982 | 3,248 | 734 | 2,871 | 2,799 | 72 |
| උප එකතුව | 19,139 | 18,000 | 1,139 | 17,027 | 16,927 | 100 |
| ප්‍රාග්ධන වියදම් | 3,764 | 3,162 | 602 | 4,571 | 2,614 | 1,957 |
| එකතුව | 22,903 | 21,162 | 1,741 | 21,598 | 19,541 | 2,057 |

සමාලෝචිත වර්ෂය සඳහා මුළු වියදමෙන් සියයට 85 ක් පුනරාවර්තන වියදම් වූ අතර සියයට 15 ක් මූලධන වියදම් විය.

## 3.3 අත්තිකාරම් ගිණුම්වල සීමාවන් පිළිනොපැදීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503 හා මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති 367.1 හි නියමයන්ට පටහැනිව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයය අංක 02 ක වියදමෙහි උපරිම සීමාව රු.556,418 කින් ඉක්මවීමක් මෙන්ම එක් ගිණුම් විෂයය අංකය ලැබීම්වල අවම සීමාව රු.954,338 කින් ළගා වී නොතිබුණි. එසේම පේෂකර්ම දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුමේ වියදමෙහි උපරිම සීමාව රු.32,416,556 කින් ඉක්මවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | රජයේ ප්‍රධාන ලැබීම් | තථ්‍ය වියදම |
|---|---|---|
| | රු.මි. | රු.මි. |
| (i) උපමාන පාදක ප්‍රදාන | 218 | 313 |
| (ii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,729 | 2,416 |
| (iii) සාමූහික ප්‍රදාන | 13,049 | 18,000 |
| (iv) වෙනත් ප්‍රදාන | 536 | 433 |
| | 15,532 | 21,162 |
| | ====== | ===== |

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලැබේ.

(අ) 2012 වර්ෂයේදී මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් මිළදී ගෙන තිබුණ රු:3,832,375 ක් වටිනා විවිධ වර්ගවලට අයත් වෛද්‍ය උපකරණ 04 ක් දඹුල්ල, මාතලේ හා දිගන රෝහල් වෙත ලබා දී තිබුණද, ඒවා මිළදී ගත් දින සිටම අක්‍රියව පැවති බැවින් භාවිතයට ගත නොහැකිව තිබුණි.

(ආ) මොරයාය, සීගිරිය, තිත්තපජ්ජල හා දොලොස්භාගේ රෝහල්වල රු.127,324 ක් වටිනා ඖෂධ කල් ඉකුත් වී තිබුණි.

(ඇ) 2009 හා 2012 වර්ෂවලදී මාතලේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගබඩාවට ලැබී තිබූ රු.1,346,155 ක් වටිනා ඖෂධ වර්ග 12 ක් කොළඹ වෛද්‍ය සැපයුම් අංශය විසින් තත්ත්වයෙන් අසමත් බවට නිර්දේශ කිරීම හේතුවෙන් ඒවා ආපසු යැවීමට හෝ සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව ගබඩාවේ පැවතුණි.

(ඇ) රාජ්‍ය නිලධාරීන් සඳහා නේවාසික පහසුකම් සැපයීම පිණිස සමාලෝචිත වර්ෂයේදී සී/ස හසලක විවිධ සේවා සමූපකාර සමිති ගොඩනැගිල්ලේ ඉහළ මාලය සංවර්ධනය කිරීම සඳහා රු.500,000ක වියදමක් දරා තිබුණද විගණන අවස්ථාව වූ 2013 පෙබරවාරි 18 දින වන විටත් එම ගොඩනැගිල්ල අදාල අරමුණ වෙත යොදා නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනය විසින් සමූපකාර සමිතිවල සේවයේ නිරත නිලධාරීන් සඳහා 2012 දෙසැම්බර් 22 දින සිට ආරම්භ කර තිබූ ඍකියාභිමුඛ වෘත්තීය කළමනාකරණ කුසලතා සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව සඳහා අයදුම්කරුවන් 106 දෙනෙකු වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස රු.300,000 ක් ගෙවා තිබුණි. එහෙත් අදාල පාඨමාලාව සඳහා නිලධාරීන් 46 දෙනෙකු පමණක් සහභාගී වී තිබුණි. සහභාගී නොවූ නිලධාරීන් 60 දෙනෙකු සඳහා සමූපකාර අරමුදලින් රු.156,250 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් කොළ 11 කින් සමන්විත මැදරට උදාව නම් සඟරාවේ පිටපතක් රු.1,658 බැගින් පිටපත් 225 ක් මුද්‍රණය කිරීම සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු වෙත රු.373,000 ක මුදලක් ගෙවා තිබුණි. මෙම සඟරාව ඉහත පිරිවිතර යටතේ එම ආයතනයෙන්ම මුද්‍රණය කර ගැනීම සඳහා විගණනය විසින් ලබාගත් මිල කැඳවීම් අනුව එකක් රු.394 බැගින් මුද්‍රණය කරගත හැකිව තිබූ බව අනාවරණය වූයෙන් ඒ සඳහා රු.284,250 ක මුදලක් වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) රෝහල් 06ක අළුත්වැඩියා කළ යුතු උපකරණවල අළුත්වැඩියා ස්වභාවය හඳුනා නොගෙන රෝහල් ඇඳන් , ට්‍රොලි, සේලයින් ආධාරක, ලොකර් ආදි උපකරණ ඒකක වශයෙන් සලකා තීන්ත ආලේප කළයුතු වර්ගඵලය පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් තොරව රු.6,053,310 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් විගණනයට ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව ඊට අදාලව රු.1,407,313 ක මූල්‍යමය අලාභයක් සිදු වී තිබූ බව අනාවරණය විය.

## 4.4 දූශ්‍ය අක්‍රමිකතා

මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයාගේ නිල වාහනය අලුත්වැඩියාවට ලක්කළ දින 45ක කාලසීමාව සඳහා දිනකට රු.5,000 බැගින් ප්‍රවාහන කුලිය ලෙස රු.225,000 ක මුදලක් සභාපතිවරයාගේ පෞද්ගලික නමට ගෙවා තිබුණි. එහෙත් එකී කාලය තුළ අවස්ථා 07 කදී ධාවනය කරන ලද දුර ප්‍රමාණය කි.මී. 18296 ක් පමණි. එහෙත් එවැනි වාහනයක් යොදාගත් බව සනාථ කිරීම සඳහා මිල ගණන් කැඳවීමේ ලිපි හෝ ධාවන සටහන් ඉදිරිපත් නොවීය.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා සේවා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා පෞද්ගලික නීති සේවා සැපයීම වෙනුවෙන් කිසිදු ගිවිසුමකින් තොරව රු.350,000ක මුදලක් 2007 වර්ෂය තුළ ගෙවා වසර 06කට අධික කාලයක් ගත වී තිබුණද එම ප්‍රඥප්තිය සංශෝධනය කිරීමට අපොහොසත් වී තිබුණි. ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළද රු.46,696 ක ගෙවා තිබුණි.

(ආ) වලපනේ දිස්තක් රෝහලේ අංශභාග රෝගී ඒකකය ස්ථාපිත නොකර තිබියදී එහි භෞතික චිකිත්සක අංශය සඳහා 2011 වර්ෂයේදී ලබා දී තිබූ රු.1,549,221 ක් වටිනා ශල්‍ය උපකරණ 04 ක් විගණිත දිනය වූ 2013 මැයි 17 වන විටත් ගබඩාවේ රඳවා තිබූ අතර එහි වගකීම් කාලයද ඉකුත් වී තිබුණි.

(ඇ) මධ්‍යම පළාත් සභා පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේදී අදාල ඉදිකිරීම් කටයුතු ගිවිසුම්ගත කාල සීමාව තුළ අවසන් නොකිරීම හේතුවෙන් එහි උපදේශක ආයතනය වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.1,934,711 ක අමතර ගාස්තුවක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) ගලේවෙල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් මා/ග/බම්බාව ප්‍රාථමික විදුහලට 2010 පෙබරවාරි 05 දින සිට අධ්‍යාපනය හැදෑරීම සඳහා කිසිඳු ශිෂ්‍යයකු පැමිණ නොසිටියදී 2010 පෙබරවාරි 05 දින සිට 2012 මැයි 31 දින දක්වා එහි සේවය කළ විදුහල්පතිවරයා විශ්‍රාම යන තෙක් ඔහු හට වැටුප් ලෙස රු.682,893 ක් ද, 2013 පෙබරවාරි 28 දින පැමිණි නව විදුහල්පතිවරයා හට 2013 මාර්තු මාසය සඳහා රු.29,410 ක්ද වශයෙන් රු.712,303 ක වැටුප් කිසිදු රාජකාර්යක නිරතවීමෙන් තොරව ගෙවා තිබුණි.

## 4.6 හඳුනාගත් පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී සහ ආයතනයන්හි පවත්වා තිබූ තොරතුරු අනුව පහත සඳහන් පාඩු හා හානි අනාවරණය වී ඇත.

(අ) පළාත් සභාවට අයත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යටතේ ඇති දේපලවලට අවස්ථා 16 කදී සිදුව තිබූ රු.31,927,853 ක හානිවලට අදාලව පරීක්ෂණ කටයුතු සිදුකර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට වර්ෂ ගණනාවක සිට කටයුතු කර නොතිබුණි.

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩසටහන් 3 ක අවස්ථා 175 කට අදාල රු.18,122,102 ක අලාභ හානි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නිසි පරිදි අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම වසර 5 ඉකුත් වූ අවස්ථා 73 කට අදාල අලාභ හානිවල වටිනාකම රු.9,449,194 ක් වූ අතර වර්ෂ 1 සිට 5 දක්වා අවස්ථා 102 කට අදාල අලාභ හානිවල වටිනාකම රු.8,672,909 ක් වී තිබුණත් එම අලාභහානිද අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ගල්පාලම ගොවිපලේ 2012 දෙසැම්බර් 31 දිනට රු.69,612 ක් වටිනා යල්පැනගිය කෘෂි රසායන ද්‍රව්‍ය අයිතම 16 ක් හා රු.23,250 ක් වටිනා බීජ අර්තාපල් හොන්ඩර 03 ක ඌනතාවයක් විය.

(ඉ) මහනුවර, මාතලේ හා නුවරඑළිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවලට අයත් වාහන 23 කට සිදුව තිබූ අනතුරු සම්බන්ධයෙන් රු.4,907,337 ක් වූ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනය

පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මඩකුඹුර මැතගම මාර්ගය වැඩිදියුණු කිරීම (අදියර II) වෙනුවෙන් රු.24,873,483 ක ගිවිසුමකට එළඹ තිබුණ ද ඒ පිළබඳ සිදු කරන ලද භෞතික පරීක්ෂා කිරීමේදී මාර්ගය නිසි ප්‍රමිතියට ඉදි කොට නොමැතිව තිබියදී රු.22,399,722 ක් ගෙවීම් කර තිබුණි.

## 4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති

මධ්‍යම පළාත තුළ විසිර් ඇති වියැකී යන ආර්ථික හා සමාජීය මෙන්ම සංස්කෘතික උරුමයන් සම්බන්ධව තොරතුරු එක්රැස කර ග්‍රන්ථයක් නිර්මාණය කර මතු පරපුර සඳහා සුරක්ෂිතව තැබීමේ අරමුණ ඇතිව මැදරට වංශකථාව නමින් ග්‍රන්ථයක් නිර්මාණය කිරීම සඳහා සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව 2011 වර්ෂය තුළ රු.760,858 ක්ද 2012 වර්ෂය තුළ ලිපි 58 ක සංස්කරණ කටයුතු සඳහා රු.567,688 ක මුදලක්ද වශයෙන් එකතුව රු.1,328,546 ක් වැයකර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද අදාල අරමුණ ඉටුකර නොතිබුණි.

## 4.9 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

හඟුරන්කෙත අධ්‍යාපන කලාපයේ පාසල් 69 කට අයත් ඉඩම් පිළිබඳ නෛතික හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා අවශ්‍ය හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.10 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සම්පත්/ බාහිර පුද්ගලයන්ට අයත් සම්පත්

### 4.10.1 වෙනත් ආයතනයන්ට මුදාහල භෞතික සම්පත්

ආයතනයේ භාවිතය සඳහා වූ භෞතික සම්පත් වෙනත් පාර්ශ්වයන් වෙත දී තිබූ අවසථා නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් සංචාරක දෙපාර්තමේන්තුව, තුම්පනේ ප්‍රාදේශීය සභාව, දඹුල්ල නගර සභාව, කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත වාහන 05 ක් මුදාහැර වසරක කාලයක් ගතවී තිබුණි.

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතු නුවරඑළිය සංචාරක බංගලාව 2006 වර්ෂයේ සිට ප්‍රවාහන අමාත්‍යාංශ කාර්යාලය සඳහාත්, මහනුවර ධර්මාශෝක මාවතේ අප්ලන්ඩ්ස්හි පිහිටි රජයේ නිවාසයක් 2010 වර්ෂයේ සිට ප්‍රධාන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම් වෙතද ලබාදී තිබුණි.

### 4.10.2 වෙනත් ආයතනවලට මුදාහල මානව සම්පත්

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි වෙනත් ආයතනවලින් ලබාගත් හා ඒවාට මුදාහල මානව සම්පත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර තිබූ පළාත් නිවාස දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීන් තිදෙනෙකුට 2011 අගෝස්ත සිට 2012 සැප්තැම්බර් දක්වා දෙපාර්තමේන්තුව විසින් රු.1,071,271ක වැටුප් ගෙවා තිබුණි.

(ආ) ජේෂකර්ම දෙපාර්තමේනතුවට අයත් මුරකරුවකු විධිමත් මුදා හැරීමකින් තොරව ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය සඳහා 2012 වර්ෂය තුළ යොදවා ගෙන ජේෂකර්ම දෙපාර්තමේන්තුවෙන් රු.345,680ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව යටතේ වැටුප් ලබන වැඩසටහන් සහකාරවරයෙකු 2009 දෙසැම්බර් 24 දින සිට දළදා මාලිගාවේ දියවඩන නිළමේතුමාගේ රාජකාරි කටයුතුවලට සහායවීම සඳහා අනුයුක්ත කර තිබුණි. දෙපාර්තමේන්තුවට ඔහුගෙන් කිසිදු සේවයක් නොලැබ තිබියදීත් 2011 හා 2012 වර්ෂවලදී ඔහුට වැටුප් වශයෙන් එකතුව රු.575,416 ක් ගෙවා තිබුණි.

### 4.10.3 වෙනත් ආයතනවලින් ලබාගත් මානව සම්පත්

ප්‍රධාන අමාත්‍යාංශයේ 2012 වර්ෂයට අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ පරීක්ෂාවේදී අවුරුදු 2 සිට 8 දක්වා කාලයක සිට අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන යටතේ වැටුප් ගෙවමින් නිලධාරීන් 08 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

### 4.11 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු, ආයතනය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,484 | 1,458 | 26 |
| තෘතියික මට්ටම | 2,180 | 1,507 | 673 |
| ද්විතියික මට්ටම | 35,495 | 32,385 | 3,110 |
| ප්‍රාථමික මට්ටම | 4,396 | 3,865 | 531 |
| | 43,555 | 39,215 | 4,340 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පති | 1,638 | 1,232 | 406 | - |
| ගුරුභවතුන් | 23,754 | 26,956 | - | 3,202 |
| සුළු සේවක | 2,057 | 523 | 1,534 | - |
| | 27,449 | 28,711 | 1,940 | 3,202 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දින වනවිට හඟුරන්කෙත හා මාතලේ යන කලාප අධ්‍යාපන කාර්යාලවල පිළිවෙළින් ගුරුභවතුන් 242 ක හා 84 ක අතිරික්තයක්ද, කොත්මලේ හා මාතලේ යන කලාපවල පිළිවෙලන් ගුරුභවතුන් 208 ක හා 89 ක පුරප්පාඩු පැවතුණි.

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් ගුරුභවතුන් විසින් මහනුවර 32 දෙනෙකුද, නුවරඑළිය 51 දෙනෙකද, හඟුරන්කෙත 24 දෙනෙකුද, හැටන් 48 දෙනෙකුද, කොත්මලේ 13 දෙනෙකුද වශයෙන් කලාප කාර්යාලවලට අයත් පාසල් 168 ක පැවති විදුහලපති පුරප්පාඩුවල, වසර 07කට අධික කාලයක සිට වැඩ ආවරණය කරමින් පැවතියද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 4.12 වාහන උපයෝජනය

උතුරු මැද පළාතට අයත් පොළොන්නරුව කලාප අධ්‍යාපන කාර්යාලයේ සේවය කරනු ලබන රියදුරකු මධ්‍යම පළාත් සභාවට අයත් වාහනයක් පැදවීමේදී සදුවී තිබූ අනතුරක් සම්බන්ධයෙන් දිසා අධිකරණයේ පනවා තිබූ නඩුවක තීන්දුවකට අනුව හානියට පත්වූ පාර්ශ්වය වෙත ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් රු.375,000 ක මුදලක් 2012 ඔක්තෝබර් 12 දින ගෙවා තිබූ අතර එකී මුදල පළාත් සභාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.13 අයවීමට ඇති සේවක ණය

2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,144,304,889 ක් වූ අතර අවු. 1 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.242,015,572 ක් විය.

## 4.14 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අඛණ්ඩ වැඩ යටතේ රු.3,764,479,867 ක අගයකට වූ වැඩ යෝජනා 6684 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අඛණ්ඩ වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| (i) සම්පූර්ණයෙන් නිමකල | 6,143 | 28 | 6,171 |
| (ii) 50% කට වඩා අඩුවෙන් නිමකල | 21 | - | 21 |
| (iii) 50% කට වඩා වැඩියෙන් නිමකල | 491 | - | 491 |
| (iv) මතභේදයට තුඩුදුන් | 01 | - | 01 |
| එකතුව | 6,656 | 28 | 6,684 |

## 4.15 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ අරමුණු

පරිගණක විෂය හැදෑරීම සඳහා Semp ව්‍යාපෘතිය යටතේ පාසල් 04 ක් වෙත පරිගණක 51 ක් ලබාදී තිබුණද, එම පාසල්වලට පරිගණක විෂය ඉගැන්වීම සඳහා ගුරුවරු පත් නොකිරීම හේතුවෙන් අදාල ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

## 4.16 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අල්ලස් පනත යටතේ චෝදනාවට ලක්ව අනිවාර්ය නිවාඩු යැවූ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ සභාපතිවරයා හට විධිමත් පරිදි යලි සේවයේ පිහිටුවීමකින් තොරව 2012 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ රු.419,250 ක මුදලක් සභාපති දීමනා ලෙස නිත්‍යානුකූල නොවන අයුරින් ගෙවීම් කර තිබුණි.

(ආ) පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු වරලත් ඉංජිනේරුවරු 5 දෙනෙකු සඳහා මාසිකව රු.15,000 බැගින්ද, උපාධිධාරීන් හා ඒ සමාන සුදුසුකම් ඇති ඉංජිනේරු හා ගණකාධිකාරිවරුන් 3 දෙනෙකු සඳහා මාසිකව රු.7,500 බැගින්ද, වශයෙන් නිලධාරීන් 08 දෙනෙකු සඳහා ආයතනයේ විධිමත් අනුමැතියකින් තොරව රු.1,702,500 ක වෘත්තීය දීමනා ගෙවා තිබුණි.

## 4.17 අවිධිමත් ගනුදෙනු

2012 වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සළසා නොතිබූ අවසථා 23 කට අදාල ආයතනමය කටයුතු ගනයෙහිලා සැලකිය නොහැකි එකතුව රු.227,440 ක් වූ විවිධ වියදම් ගෙවා තිබුණි.

## 4.18 අරමුණට පටහැනි ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 ජනවාරි 18 දිනැති අංක 1480/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාර මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධීකාරියට අයත් මාර්ග සංවර්ධන කටයුතු සඳහා ලද රු.89,106,711ක පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් පළාත් පාලන ආයතන සතු (ප්‍රාදේශිය සභාව සතු) මාර්ග පද්ධතිය පිළිසකර කිරීම සඳහා යොදා ගෙන තිබුණි.

(ආ) එන්නත් හා ප්‍රතිශක්තිකරණය පිළිබඳ ගෝලීය සංවිධානය යටතේ සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ අරමුණ මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම මගින් සේවා පහසුකම් අඩු ප්‍රදේශවල මාතෘ හා ළමා සෞඛ්‍ය ආශ්‍රිත රෝගාබාධ නිසා ඇතිවන මරණ සංඛ්‍යාව අඩු කිරීම වුවත් , එම අරමුණට පටහැණිව අවස්ථා 06 කදී එකතුව රු.1,952,892 ක් වූ ඉදිකිරීම් හා මිළදී ගැනීම් සඳහා වැයකර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් එම සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම් පිළියෙල කිරීම
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) තොග පාලනය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) වාහන උපයෝජනය
(උ) කාර්ය මණ්ඩල කළමනාකරණය